සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2020 ජනවාරි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2020-01-18
සෙනසුරාදා
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය සඳහන් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.4 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** 2016 අප්‍රේල් 01 දින, **සීමාසහිත ABC සමාගම** විසින් අත්පත් කරගත් මෝටර් රථයක් 2019 සැප්තැම්බර් 30 දින රු.1,400,000/- කට විකුණන ලදී. මෝටර් රථයේ පිරිවැය රු.3,200,000/- කි. මෝටර් රථ, වාර්ෂිකව, 20% බැගින්, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට සමාගම ක්ෂය කරනු ලබන්නේ නම්, මෝටර් රථය විකිණීමෙන් ලද ලාභය වන්නේ:

(1) රු.120,000/- කි. (2) රු.440,000/- කි. (3) රු.200,000/- කි. (4) රු.760,000/- කි.

(ලකුණු 02)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, දේපළ පිරියත සහ උපකරණ සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) වාහන නිෂ්පාදන සමාගමක ඇති අඩක් නිම කරන ලද වාහනයක්.

(2) ගෘහ භාණ්ඩ අලෙවිසැලක විකිණීම සඳහා තිබෙන ගෘහ භාණ්ඩ.

(3) කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා තිබෙන පරිගණක.

(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, සීමාසහිත පොදු සමාගමක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය තෝරන්න:

(1) කොටස්හිමියන්ගේ උපරිම ගණන පනහ (50) කි.

(2) අධ්‍යක්ෂවරුන්ගේ අවම ගණන එක (01) කි.

(3) සමාගමේ කොටස් මහජනයාට නිකුත් කිරීම කළ හැකිය.

(4) වාර්ෂික වාර්තාව නිකුත් කිරීම අනිවාර්ය නොවේ. (ලකුණු 02)

**1.4** පහත සඳහන් ප්‍රකාශනයන් තොග සම්බන්ධයෙන් වේ:

**(a)** ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් [First In First Out (FIFO)] පදනම යටතේ ප්‍රථමයෙන් මිලදී ගත් හෝ නිෂ්පාදනය කරන ලද තොග අයිතමයන් මුලින් විකුණන බව උපකල්පනය කෙරේ.

**(b)** තොග, පිරිවැයට පමණක් මැනිය යුතු වේ.

**(c)** කාර්යාලයීය භාවිතය සඳහා තබා ඇති වත්කම් තොගයෙහි අඩංගු වේ.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 02 (LKAS - 02) තොග අනුව, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(c)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(a)** සහ **(b)** පමණි. (ලකුණු 02)

*අංක 1.5 සිට 1.8 දක්වා ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන්න.*

**1.5** **ඇනී, බෙනී** සහ **කැනී,** ලාභ/අලාභ පිළිවෙලින් 3:2:1 අනුපාතයට බෙදාගත් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. **බෙනී** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **ඇනී** සහ **කැනී** ලාභ/අලාභ පිළිවෙලින් 5:3 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

නව හවුල් ව්‍යාපාරයේ **ඇනීගේ** සහ **කැනීගේ** භුක්ති විඳීමේ අනුපාතය (gaining ratio) ගණනය කරන්න.(ලකුණු 03)

**1.6** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ සඳහන් ප්‍රතිපාදන තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.7** මූල්‍ය ප්‍රකාශනවල සංරචක (components) තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සමනල ක්‍රීඩා සමාජයේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

| | |
|---|---|
| 2019 ජනවාරි 01 දිනට සාමාජිකයන් ගණන | 123 |
| 2019 වර්ෂය තුළදී අලුතින් එකතු වූ සාමාජිකයන් ගණන | 34 |
| 2019 වර්ෂය තුළදී ලැබූ සාමාජික මුදල් | රු.504,000/- |
| සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල | රු.3,000/- |

2019 වර්ෂය තුළදී ලැබුණු සාමාජික මුදල්වල සංයුතිය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා | සාමාජිකයන් 9 |
| 2019 වර්ෂය සඳහා | සාමාජිකයන් 151 |
| 2020 වර්ෂය සඳහා | සාමාජිකයන් 8 |

ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුමේ හඳුනාගත යුතු සාමාජිකයින්ගේ දායක මුදල ගණනය කරන්න. (ලකුණු 03)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ඩයනා (පෞද්ගලික) සමාගමේ,** 2019 දෙසැම්බර් 31 දිනට මුදල් පාලන ගිණුමට අනුව බැංකු ශේෂය රු.625,250/- ක හර ශේෂයක් පෙන්නුම් කෙරේ. නමුත් බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ ශේෂය රු.169,750/- කි. එකී වෙනසට හේතු ලෙස පහත සඳහන් දෑ පසුව සොයා ගන්නා ලදි:

(1) ණයහිමියෙකුට නිකුත් කරන ලද රු.72,500/- ක් වූ චෙක්පතක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

(2) ගනුදෙනුකරුවෙකු විසින් සෘජුවම බැංකු ගිණුමට රු.110,200/- ක් තැන්පත් කර තිබෙන අතර, එය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොමැත.

(3) මාසික ණයවාරිකය සඳහා බැංකුවට ලබාදී ඇති රු.550,000/- ක ස්ථාවර නියෝගයක්, මුදල් පාලන ගිණුමේ සටහන් කර නොමැත.

(4) 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත් රු.85,000/- කි.

(5) මුදල් පාලන ගිණුමේ සටහන් නොකළ මාසයට අදාල බැංකු ගාස්තු රු.3,200/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 දෙසැම්බර් මාසය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) සංශෝධිත මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත HC (පෞද්ගලික) සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

**සීමාසහිත HC (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් 01 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු.297,750/- ක් වූ අතර, 2019 දෙසැම්බර් මාසයේ සිදුවූ ගනුදෙනු පහත සඳහන් පරිදි වේ:

| | රු. |
|---|---|
| ණයට විකුණුම් | 204,300 |
| ආපසු එවුම් | 27,675 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 117,450 |
| දුන් වට්ටම් | 7,500 |
| ලියාහරින ලද බොල් ණය | 1,290 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 දෙසැම්බර් මාසය සඳහා ණයගැති පාලන ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත HC (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් 31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය, තනි තනි (individual) ණයගැති ලෙජර් ගිණුම් ශේෂවල එකතුවට වෙනස් වේ. 2019 දෙසැම්බර් 31 දිනට තනි තනි ණයගැති ලෙජර් ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.340,410/- ක් විය.

පසුව කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් වැරදි අනාවරණය විය:

(1) 2019 දෙසැම්බර් මාසයේ විකුණුම් ජර්නලයෙහි (දෛනික විකුණුම් පොත) එකතුව රු.17,025/- ක් වැඩියෙන් එකතු කර තිබුණි.

(2) වෙළෙඳ ණයගැතියෙකුගෙන් ලද රු.9,300/- ක මුදලක්, ණයගැති පාලන ගිණුමේ නිවැරදිව වාර්තාකර තිබුණු නමුත්, අදාල ණයගැතියාගේ ලෙජර් ගිණුමේ වාර්තාකර නොතිබුණි.

(3) රු.22,500/- ක ණයට විකුණුම් ඉන්වොයිසියක් වැරදීමකින් ගැනුම් ජර්නලයේ (දෛනික ගැනුම් පොත) සටහන් වී තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 දෙසැම්බර් මාසය සඳහා සංශෝධිත ණයගැති පාලන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

**ඩැනී, බර්නි සහ මර්ලි, DBM නම් හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවන් වන අතර, ඔවුන් ලාභා'ලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදා ගනු ලැබේ.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුළත් වේ:

- හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත, වර්ෂයකට 12% බැගින් පොලී ගෙවනු ලබයි.
- **බර්නි,** වර්ෂයකට රු.1,800,000/- ක වේතනයක් ලැබීමට හිමිකම් ලබයි.

(2) 2019 මාර්තු 31 දිනට, හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදී:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **ඩැනී** | | 12,000 |
| **බර්නි** | | 9,000 |
| **මර්ලි** | | 6,000 |
| 2018 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම්: | | |
| **ඩැනී** | | 3,000 |
| **බර්නි** | 1,200 | |
| ගැනිලි: | | |
| **ඩැනී** | 1,500 | |
| **බර්නි** | 750 | |
| **මර්ලි** | 1,500 | |

(3) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.8,775,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

## **05** වන ප්‍රශ්නය

2019 දෙසැම්බර් මාසය සඳහා **සීමාසහිත මහී (පෞද්ගලික) සමාගමේ** වැටුප් ලේඛනයෙන් (payroll) පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

| **මූලික වැටුප (රු.)** | **අතිකාල (රු.)** | **සේවක අර්ථසාධක අරමුදලට (EPF) අඩුකිරීම් (8%) (රු.)** | **ශුද්ධ වැටුප (රු.)** |
|---|---|---|---|
| 10,875,000 | 13,650,000 | 870,000 | 23,655,000 |

සේවක අර්ථසාධක අරමුදලට [Employees’ Provident Fund (EPF)] සහ සේවක භාර අරමුදලට [Employees’ Trust Fund (ETF)] සමාගමේ දායකත්වය මූලික වැටුපෙන් පිළිවෙලින් 12% ක් සහ 3% ක් වේ.

මාසික වැටුප් ගෙවීම අදාල මාසයේ අවසාන වැඩකරන දිනයේ ගෙවනු ලබන අතර, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීම ඊළඟ මාසයේ 10 දින ගෙවනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත මහී (පෞද්ගලික) සමාගමේ** 2019 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම් **පිළියෙල කරන්න**:

(a) වැටුප් පාලන ගිණුම. (ලකුණු 02)

(b) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම. (ලකුණු 02)

(c) ගෙවිය යුතු සේවක භාර අරමුදල් (ETF) ගිණුම. (ලකුණු 01)

(මුළු ලකුණු 05)

## **06** වන ප්‍රශ්නය

එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමක් වන **සීමාසහිත වට් මෝ (පෞද්ගලික) සමාගමේ,** 2019 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| විකුණුම් [එකතුකළ අගය මත බදු (VAT) රහිතව] | 11,250,600 |
| මාසය තුළ සිදුකළ එකතුකළ අගය මත බදුවලට යටත්වන දේශීය මිලට ගැනුම් [එකතුකළ අගය මත බදු (VAT) ඇතුළත්ව] | 5,949,985 |
| මාසය තුළදී ලබාගත් එකතුකළ අගය මත බදුවලට යටත්වන සේවා [එකතුකළ අගය මත බදු (VAT) ඇතුළත්ව] | 1,312,035 |
| 2019 දෙසැම්බර් 01 දිනට එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය | 225,700 |

අදාල වන එකතුකළ අගය මත බදු (VAT) අනුපාතය 15% කි.

සමාගමේ සියලුම මිලදී ගැනීම් සහ සේවා සඳහා නියමිත බදු ඉන්වොයිසි තිබෙන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 දෙසැම්බර් මාසය සඳහා එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**ස්ටාර් නර්තන සමාජය** මහජනයා සඳහා නාට්‍ය ප්‍රදර්ශනය කරන අතර, එහි සාමාජිකයන් සඳහා අවන්හලක් පවත්වාගෙන යනු ලැබේ.

පහත සඳහන් තොරතුරු **ස්ටාර් නර්තන සමාජයේ** පොත්වලින් උපුටා ගන්නා ලදි:

(1) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ස්ටාර් නර්තන සමාජයේ** ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත සඳහන් පරිදි වේ:

*(රු.'000)*

| **ලැබීම් සහ ගෙවීම් ගිණුම** | | | |
|---|---|---|---|
| 2019 ජනවාරි 01 දින ඉ/ගෙ ශේෂය | 11,250 | ලේඛන කටයුතු (secretarial) වියදම් | 900 |
| පරිත්‍යාග | 12,450 | ගොඩනැගිල්ල මත කුලිය | 5,400 |
| ප්‍රවේශපත්‍ර විකුණුම් | 32,250 | අවන්හලේ සැපයුම්කරුවන්ට කළ ගෙවීම් | 27,300 |
| සාමාජික දායක මුදල් | 8,100 | අවන්හලේ වියදම් | 4,800 |
| අවන්හලේ විකුණුම් | 42,450 | ආරාධිත කලාකරුවන්ගේ ගාස්තු | 1,500 |
| | | මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදම් | 2,250 |
| | | රඟහලේ උපකරණ (2019 දෙසැම්බර් 31 දින අත්පත් කරගන්නා ලද) | 22,500 |
| | | නාට්‍ය නිෂ්පාදන වියදම් | 27,000 |
| | | නාට්‍ය මත වෙනත් වියදම් | 6,150 |
| | | 2019 දෙසැම්බර් 31 දින ප/ගෙ ශේෂය | 8,700 |
| | **106,500** | | **106,500** |

(2) 2019 ජනවාරි 01 දිනට සහ 2019 දෙසැම්බර් 31 දිනට වෙනත් වත්කම් සහ වගකීම් පහත පරිදි වේ:

*(රු.'000)*

| | **2019 ජනවාරි 01 දිනට** | **2019 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| අවන්හලේ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 1,800 | 2,100 |
| ඉදිරියට ලැබූ සාමාජික දායක මුදල් | 300 | 75 |
| හිඟ සාමාජික මුදල් | 750 | 450 |
| රඟහලේ උපකරණ - ධාරණ අගයට | 67,500 | 81,000 |
| අවන්හලේ තොග - පිරිවැයට | 4,200 | 3,300 |

(3) පරිත්‍යාග, කාලපරිච්ඡේදය සඳහා ආදායමක් වශයෙන් හඳුනාගත යුතුය.

(4) වර්ෂය තුළදී රඟහලේ උපකරණ ඉවත් කිරීමක් (no disposal) සිදුකර නොමැත.

(5) ගොඩනැගිල්ලේ කුලියෙන් හරි අඩක් (½) අවන්හලට අදාල වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ස්ටාර් නර්තන සමාජයේ** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) අවන්හලේ වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**සදුනි, කසුනි** සහ **තදුනි, මුත් ට්‍රේඩින්** නම් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ අතර, ලාභා'ලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදාගනු ලැබේ.

පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කොන්දේසි ඇතුළත්ය:

- හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත වාර්ෂිකව 12% බැගින් වූ පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකම් ඇත.
- රු.60,000/- බැගින් වූ මාසික වැටුපක් ලැබීමට **කසුනිට** හිමිකම ඇත.

(2) 2019 දෙසැම්බර් 31 දිනට **මුත් ට්‍රේඩින්** හි ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදි:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **සදුනි** | | 7,500 |
| **කසුනි** | | 9,000 |
| **තදුනි** | | 10,000 |
| 2019 ජනවාරි 01 දිනට ජංගම ගිණුම්: | | |
| **සදුනි** | | 3,000 |
| **කසුනි** | 1,200 | |
| **තදුනි** | | 1,500 |

(3) 2019 දෙසැම්බර් 31 දින, **තදුනි** තම පෞද්ගලික හේතු මත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර ඇත. **තදුනිගේ** විශ්‍රාම යැමෙන් පසු, **සදුනි** සහ **කසුනි** හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගැනීමට තීරණය විය.

(4) 2019 දෙසැම්බර් 31 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,500,000/- කට අගය කළ අතර, එය කීර්තිනාම ගිණුමක් භාවිත නොකොට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීම් කළ යුතු වේ.

(5) 2019 දෙසැම්බර් 31 දිනට, ජංගම නොවන වත්කම් පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදි:

| | **2019 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කළ අගය (රු.'000)** | **2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය (රු.'000)** | **2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000)** |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 5,400 | 7,500 | 4,200 |
| මොටර් වාහන | 900 | 2,250 | 750 |

ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණන අගයට හවුල් ව්‍යාපාරයේ පොත්වල පවත්වාගෙන යනු ලැබේ.

(6) විශ්‍රාම ගැනීම නිසා **තදුනිට** ගෙවිය යුතු මුළු මුදලම ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

(7) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.4,500,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **මුත් ට්‍රේඩින්** හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 05)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## **09** වන ප්‍රශ්නය

**පවනි ට්‍රේඩර්ස්** නම් වූ කේවලස්වාමි ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

(1) වත්කම් සහ වගකීම් පහත පරිදි වේ:

*(රු.'000)*

| | **2018 අප්‍රේල් 01 දිනට** | **2019 මාර්තු 31 දිනට** |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි - ධාරණ අගයට | 7,500 | 7,200 |
| මෝටර් වාහන - ධාරණ අගයට | 10,500 | 11,100 |
| තොග | 3,750 | 3,600 |
| වෙළෙඳ ණයගැතියන් | 4,200 | 4,050 |
| ඉදිරියට ගෙවූ රක්ෂණය | 750 | 900 |
| බැංකු ශේෂය | 1,950 | ? |
| වෙළෙඳ ණයහිමියන් | 2,400 | 2,025 |
| උපචිත විදුලිය | 330 | 255 |

(2) **පවනි** විසින් ව්‍යාපාරයට අදාලව නිසි පරිදි ගිණුම් පොත්පත් පවත්වා නොගන්නා අතර, 2018 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා බැංකු ප්‍රකාශනවල සාරාංශයක් පහත පරිදි වේ:

| **ලැබීම්** | **රු.** |
|---|---|
| මුදලට විකුණුම් | 5,250,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,750,000 |
| **ගෙවීම්:** | |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 1,875,000 |
| මුදලට ගැනුම් | 2,250,000 |
| නව මෝටර් රථයක් මිලට ගැනීම | 1,500,000 |
| රක්ෂණය | 375,000 |
| විදුලිය | 420,000 |
| වැටුප් | 2,100,000 |
| වෙනත් වියදම් | 495,000 |

(3) **පවනි** විසින් ව්‍යාපාරයේ සියලු මුදල් ලැබීම් බැංකු ගතකර ඇති අතර, ව්‍යාපාරයේ සියලු ගෙවීම් චෙක්පත් මගින් සිදුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු 31 දිනට **පවනි ට්‍රේඩර්ස් හි** ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

**සීමාසහිත අසේනි (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,000,000) | | 108,000 |
| 2018 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 25,600 |
| 12% ණයකර | | 40,000 |
| ඉඩම සහ ගොඩනැගිලි - පිරිවැයට (ඉඩම - රු. මිලියන 20) | 100,000 | |
| මෝටර් වාහන - පිරිවැයට | 75,000 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 32,000 |
| මෝටර් වාහන | | 30,000 |
| 2019 මාර්තු 31 දිනට තොගය - පිරිවැයට | 184,900 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 74,300 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 14,730 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 162,300 |
| 2018 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 1,800 |
| විකුණුම් | | 839,780 |
| විකුණුම් පිරිවැය | 641,350 | |
| බෙදාහැරීමේ වියදම් | 43,600 | |
| විදුලිය සහ ජලය | 12,200 | |
| අධ්‍යක්ෂක ගාස්තු | 12,000 | |
| කාර්යාල මණ්ඩල වැටුප් | 35,800 | |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 3,700 | |
| දුරකතන ගාස්තු | 2,800 | |
| වාහන නඩත්තු වියදම් | 3,300 | |
| විගණන ගාස්තු | 1,100 | |
| වෙනත් පරිපාලන වියදම් | 8,200 | |
| සාමාන්‍ය කොටස් සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 18,500 | |
| ගෙවූ ණයකර පොලී | 2,400 | |
| 2018 අප්‍රේල් 01 දිනට ආදායම් බදු වෙන්කිරීම | | 12,700 |
| ගෙවූ ආදායම් බදු | 18,300 | |
| **එකතුව** | **1,252,180** | **1,252,180** |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට පැවති තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.184,200,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කරන ලදී.

(2) සමාගම වෙත රු.2,300,000/- ක් ගෙවීමට තිබූ ගනුදෙනුකරුවෙකු 2019 ජූලි 20 දින බුන්වත්භාවයට ප්‍රකාශ කරන ලද අතර, එම ලැබිය යුතු මුදල අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, වර්ෂය අවසානයේ ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය වශයෙන් පවත්වාගත යුතු බවට තීරණය කරන ලදී.

(3) පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් 2019 මාර්තු 31 දිනට ගිණුම්ගත කළ යුතු වේ:

| | | |
|---|---|---|
| කලින් ගෙවූ වාහන නඩත්තු වියදම් | : | රු.200,000/- |
| උපචිත විදුලිය | : | රු.100,000/- |

(4) ගොඩනැගිලි සහ මෝටර් වාහන, පිරිවැය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කරන අතර, වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 10 |

(5) 2017/18 වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.13,300,000/- ක් වූ අතර, සම්පූර්ණ මුදලම වර්ෂය තුළදී ගෙවා දමන ලදී. 2018/19 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.11,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(6) 2018 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.1,000/- බැගින් වූ 12% ණයකර 40,000 ක් නිකුත් කරන ලදී. ණයකර මත පොලිය වර්ෂයකට දෙවතාවක් (biannually) ගෙවිය යුතු වේ.

(7) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2019 ජූලි 31 දින අනුමත කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත අසේනි (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |